
**SINHALA** - *"Who will deliver me?"*

# මා මුදන්නේ කවුද?

එක් ඉරු දිනක අප්‍රිකාවේ ලෙසතෝ හි ගම්මානයක ගෝත්‍රික නායකයෙකුට දෙවියන්වහන්සේගේ බලවත් සුභාරංචිය දේශනා කරමින් සිටියෙමි. දේව වචනය අසන පිණිස එ කී ගෝත්‍රික නායකයා හා ඔහුගේ බිරිඳ සමග විශාල සෙනගක් රැස්ව සිටියහ. සැබවින්ම , මෙම ජීවමාන වචනය මිනිසුන්ගේ හදවත් තුලට කිඳා බසින්නා වූ දෙමුහත් කඩුවකට වඩා තියුණු විය.

දේශනා කරමින් සිටින අතරේ ඒ මහා ගෝත්‍රික නායකයාගේ රැජින වූ භාර්යාව දැඩි ලෙස හඬා වැලපෙන්නට පටන් ගත්තේය. කඳුළු ඇගේ කම්මුල් දිගේ ගලන්නට විය. ඇය නැගිට මෙසේ පවසන්නට වූවා ය. '' මාව මුදන්නේ කවුද? කරුණාකර මට උදව් වන්න. මගේ හදවත දුකින් පිරී ඇත. මම ඉතා අවාසනාවන්ත කාළකණ්ණි තැනැත්තියක්. මට උදව් කරන්න පුළුවන් කාට ද? පාපයේ ජරා බැඳුම් වලින් මා මුදන්නේ කවුද? මම මොනව ද කරන්නේ ? මම නායකයාගේ ( රැජින ) බිරිඳ බවත්, ගැහැනු අතරින් එක් කෙනෙකු බවත්, ඔබලා මාව ඉතාම හොඳින් දන්නවා '' යනුවෙන් පැවසුවාය.

ඈ තවදුරටත් '' මම විසි වසරක සිට ආගමික කටයුතු වල යෙදී තිබෙනවා. ඒ කිසිවකින් මට පිළිසරණක් වුනේ නැහැ. මාව වෙලා තිබුණු පාපයේ වහල් බැමි වලින් මුදා හරින්නට ඔවුන්ට හැකි වුනේ නැහැ. මම බේබදු ගැහැණියක්. මගේ දෑත් නපුරෙන් කිලිටි වී තිබෙනවා. මම ශාපලත් මත් ද්‍රව්‍ය වූ අරක්කු, බියර් පෙරන්න ඒ මගින් මාව පොළඹවා තිබෙනවා. මාගේ දෑත් දෙපා පාපයෙන් බඳිනු ලැබ තිබෙනවා. මම සදාකාලික නිරයේ හිරකරුවෙක් ! ''



*" පව් කරන තැනැත්තේ යක්ෂයාගෙන්ය. මක්නිසාද යක්ෂයා පටන් ගැන්මේ සිට පව් කරන්නේය " 1 යොහාන් 3 : 8.*

මෙසේ කියන අතරතුර ඈ නැවත බලවත් ශෝකයෙන් මෙසේ කෑගසා '' මට උදව් කරන්න, කවුද මාව මුදන්නේ ? මේ පාපයේ බැඳුම් වලින් මාව මුදන්නේ කවුද? මම දෙවියන් වහන්සේ ගැන දැන සිටියත් පාපය මාව පාලනය කරනවා. පාපය මාව නිරයට අදිමින් සිටිනවා. මගේ කුලුදුල් පුතාව මම මැරුවා. මම බීලා මත්වෙලා සිටි වේලාවක මගේ පුතාව කරේ තියාගෙන යද්දී මාව බිම පෙරලුනා. ඒ වේලාවේ පුංචි පුතාගේ ඔළුව පොලොවේ වැදී චප්ප වුනා. මගේ දරුවා එලෙස මැරුනා. මම මිනීමරු ස්ත්‍රියක්. මේ මරණයෙන් මාව මුදන්ට මට උදව් කරන්න. එදා මගේ ශ්‍රෝත්‍රික චාරිත්‍ර වාරිත්‍ර මට උදව් කලේ නැහැ. ආගම මට උදව් කලේ නැහැ. මට උදව් කරන්න පුලුවන් කාටද? මාව මුදන්නේ කවුද?

ඒ අවස්ථාවේ මම ඇයට මෙසේ පිළිතුරු දුනිමි.'' භය නොවන්න. බලාපොරොත්තු සුන් කර ගන්න එපා. ඔබගේ ඔය ප්‍රශ්න හැම කෙනෙකුටම තිබෙනවා. **ඔබේ හදවතේ නැගෙන වේදනාවට පිළිතුර බයිබලයේ ඇත. පාපය අපගේ ජීවිත පාලනය කරයි. නමුත් එක් කෙනෙකුට අපව සම්පූර්ණයෙන් මුදන්ට හැකි බව එහි කියා තිබේ. ''**

'' මම මාංශිකව පාපයට විකුණන ලැබ සිටිමි. මා කරන දේ මම නොදනිමි. මා කරන්නේ මා කැමති දේ නොව මා ද්වේෂ කරන දේය. ඉතින් මම අකමැති එක කරම් නම් ....... එය කරන්නේ මා නොව මා තුල වාසය කරන පාපය, මා තුල එනම් මාගේ ශරීරය තුල කිසි යහපතක් වාසය නොකරන බව දනිමි. මක්නිසාද කැමැත්ත මට ඇත්තේය යහපත් දේ කිරීම මට නැත්තේය. මම කැමති යහපත නොකර අකමැති නපුර කරමි. ඉතින් මම කැමති නැති දේ කරම් නම්, ඒක කරන්නේ මා නොව මා තුල වාසය කරන පා-පයය. මාගේ අවයව තුල තිබෙන පාපයාගේ නීතිය යටතෙහි මා වහල්කමට පමුණුවන්නා වූ වෙනත් නීතියක් මාගේ අවයව තුල තිබෙන බව මට පෙනේ. ( රෝම 7 : 15 - 25 ) '' **අනේ මම කාලකන්නි මනුෂ්‍යයෙක්ය. මේ මරණීය ශරීරයෙන් මා මුදන්නේ කවුද?.**

## මෙයයි පිළිතුර


***" පුත්‍ර වූ යේසුස් වහන්සේ නුඹලා නිදහස් කරන්නේ නම් සැබවින්ම නුඹලා නිදහස්ය. " යොහාන් 8 : 36***

ඔබගේ සියලු ප්‍රශ්න වලට පිළිතුර යේසුස් වහන්සේ පමනි. '' යේසුස් '' යන නාමය තුල පමනි ගැලවීම ඇත්තේ. මනුෂ්‍යයන් අතරේ දෙන ලද වෙන නාමය-ක් ස්වර්ගයෙන් යට නැත. ( ක්‍රියා 4 : 12 ) අපේ පාපයෙන් අපව මිදිය හැක්ෙ-ක් යේසුස් වහන්සේට පමනි. සියලු පව් වලින් අපව පවිත්‍ර කල හැක්කේ කල්වාරියේ වැගුරුවාවූ යේසුස් වහන්සේගේ ඒ අනර්ඝ ලේ වලට පමණි. අපව පාපයෙන් මුදා ගැනීමට මනුෂ්‍යන් වූ වෛද්‍යවරයෙකුටවත් , මන්ත්‍රචාර්යවරයෙකුටවත්, දේශනාකාරයෙකුට හෝ පූජකයෙකුටවත් කිසි බෙහෙතකටවත්, දේවස්ථානයකටවත් නොහැක. අපව පාපයෙන් මුදාලිය හැක්කේ ලෝකයාගේ සකල පාප උදෙසා තම දිවි පූජා කලා වූ දෙවියන් වහන්සේගේ බැටළු පැටවාණන් වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ හා එතුමාගේ නිර්මල වූ ලේ වලින් පමණකි.

උන්වහන්සේ මොලොවට වැඩියේ'' අන්ධ වූ ඇස් ඇරින්නටත්, හිරකාරයන් හිරගෙයින්ද, අන්ධකාරයෙහි ( පාපයේ ) ඉන්නන් ඇඳිරි ගෙයින් ද පිටතට ගෙනෙන්ටත්ය. '' යෙසායා 42 : 7 යේසුස් වහන්සේ කියන සේක් '' පව් කරන සියල්ලෝම පාපයාගේ වහලුන්ය. ... පුත්‍ර වූ

යේසුස් වහන්සේ ඔබව නිදහස් කරන්නෙහි නම් සැබවින්ම ඔබ නිදහස්ය. ( යොහාන් 8 :34 36 ) මාර්ගයත්, සත්‍යයත්, ජීවනයත් වූ යේසුස් වහන්සේ ඔබව පාපයේ සියලුම යදම් වලින් නිදහස් කරනු ඇත.

යේසුස් වහන්සේ කල්වාරි කුරුසිය මත දී අපගේ සියලුම පාපයත් තම ශරීරයෙන් ඉසු ලූ සේක. ඔබගේ සියලු පව් කුරුසියෙහි ඇණ ගසා තිබේ. '' සැබවින්ම උන්වහන්සේ උසුලා ගත්තේ අපේ දුක් ය. දරා ගත්තේ අපේ ශෝකයය. ... උන්වහන්සේ තුවාල ලැබුවේ අපේ අපරාධ නිසාය, පොඩි කරනු ලැබුවේ අපේ අයුතුකම් නිසාය. අපට සමාදානය ගෙන දෙන දඬුවම උන්වහන්සේ මතට පැමිණුනේය. උන්වහන්සේගේ පහර වලින් අපට සුවය ලැබී තිබේ ( යෙසායා 53 : 3 - 7 ).




" *යේසුස් වහන්සේ නුඹ නිදහස් කරනවා නම් සැබවින්ම නුඹ නිදහස්ය.*" *යොහාන් 8 : 36*

එකල විසූ බරබ්බස් වනාහි සොරෙකු මිනීමරුවෙකු වූවා සේම මරනයට නියම වූ අපරාධකරුවෙකි. ඔහුව කුරුසියේ ඇන ගැසීමට නියම වූ නමුත් යේසුස් වහන්සේ ඒ අපරාධකරුවාගේ ස්ථානය ගෙන ඔහු මිය යුතුව තිබුණා වූ කුරුසිය තමන් කර මතින් රැගෙන යන ලදි. බරබ්බස්ගේ ස්ථානය ගත්, කුරුසපත් වූ යේසුස් වහන්සේ ඔහුගේ පමනක් නොව ඔබේත් මගේත් ස්ථානය ගත් සේක. මිනිමරුවෙකු නිදහස් කරන පිණිස උන්වහන්සේ ඔහු වෙනුවෙන් මරණයට පත් වූ සේක. ඔබත් මමත් ඒ බරබ්බස් වැනිය.

පාපයේ කුලී නම් මරණයයි. එහෙත් දෙවිඳුන්ගේ දීමනාව නම් යේසුස් තුමන් තුලින් සාදකාල ජීවනයයි. ඔබ විශ්වාසයෙන් යේසුස් තුමන්ගේ කුරුසිපත් වීමේ ක්‍රියාව දෙස බලනවා නම් ඔබත්, ඔබේ පාපයත් කුරුසියෙහි ඇණ ගසා තිබෙනු දැකිය හැකිය. ඔබ සදහටම ජීවත් වන පිණිස යේසුස් තුමන් කුරුසිය මත දී ඔබේ ස්ථානය ගත් සේක. ඔබේ පාපයට කමාව දෙන පිණිස එතුමන් තම රුධිරය වැගුරූ සේක. දෙවිඳුන් තම එකම පුත්‍රයාණන් මරණයට පාවා දී ඔබට ප්‍රේම කලේ ඔබව පාපයේම මිය යන්න නොදී සාදාකාල ජිවනය නොමිලේ ඔබට ලබා දෙනු පිණිසය.

මේ සුභාරංචිය ඇසූ ශ්‍රෝතික බිරිඳ යේසුස් තුමන් කෙරෙහි අදහා තම හදවත

එතුමාට භාර දුන්නාය. ඇගේ පාපි සිත එතුමාට භාර දී දෙවිඳුන් ඇගේ පාපි සිත එතුමන්ගේ ලේ වලින් පවිත්‍ර කර අලුත් සිතක් ඇයට දානය කර ශුද්ධාත්මයාණන්ගෙන් ඇගේ සිත පිරවූ සේක. ඇගේ සියලු පාප වලට කමා කර පාපයේ බලයෙන් ද මිදූ සේක. එදා සිට ඇය සියලු පාප ක්‍රියාවන්ගෙන් මිදී පිරිසිදු දිවියක් ගත කලා. '' යමෙකු ක්‍රිස්තුස් වහන්සේ තුල සිටිනවා නම් ඔහු අලුත් මැවිල්ලක්ය. පරණ දේ පහව ගියේය ; මෙන්න සියල්ල අලුත් වී තිබේ '' (2 කොරින්ති 5 : 17)

ප්‍රිය පාඨකය, ඔබ ද ඔබ වහල් වී සිටින්නා වූ සියලු පාපිෂ්ඨ දුරාචාරයන්ගෙන් ද, රෝග හා ඇබ්බැහිවීම් ඇතුලු සියලු ප්‍රශ්න ගැටලු වලින් ද යේසුස් තුමන් තුලින් මිදීම ලද හැකිය.

'' **වෙහෙස වන්නා වූ ද බර උසුලන්නාවූ ද සියල්ලෙනි එන්න මා වෙතට මම ඔබට සහනය දෙමි** '' කියූ යේසු තුමන් වෙත මේ දැන්ම එන්න. ඔබගේ සියලු පාප හා ගැටලු කියා සිටින්න. ඔබ යටහත්ව අදහන්නාවූ සිතකින් එතුමා වෙත ලගා වන්නේ නම් ඔබව ඉවත නොදමයි. සමහර විට ඔබ යම් ආගමක සිටිය ද පාපයේ යදම් වලින් තවම බැඳී සිටිය ද එසේම උන්වහන්සේ වෙතට එන්න. උන්වහන්සේ ඔබේ සියලු අයුතුකම් කමා කර ඔබේ **සියලු රෝග, ගැටලු** විසඳන සේක. ඔබව ජීවිත විනාශයෙන් මුදවා උන්වහන්සේගේ දයාවෙන් ඔබව සුරකින සේක. ( ගීතාවලිය 103 : 3 )

යේසුස් තුමන්ගේ නාමයෙන් ඔබ පසුතැවිලිව මෙසේ යාච්ඤා කරන්න. '' ආදර යේසුනි,සැබවින්ම මම පව්කාරයෙකි. මා නිසා ඔබ කල්වාරි කුරුසියේ දිවි පුදා මාගේ සියලු පාපයට, ශාපයට, පූජාවක් වූ බව දනිමි. මාගේ ජීවිතයේ එකම ගැලවුම්කරුතුමා ඔබ බව පිළිගනිමි. මා ඔබේම දරුවෙකු කර ගන්න. මේ සෑම යේසුස් වහන්සේගේ නාමයෙන් ඉල්ලා සිටිමි - ආමෙන්.''

---

Kindly write to us if you are able to assist us with further translations of our free Gospel literature, informing us of the language into which you could translate this Gospel literature. Your assistance would be appreciated.

If you have found salvation in Christ, or have been otherwise blessed through our Gospel literature, please let us know. We would like to thank God with you, and remember you further in our prayers.
**Our Heart Book is now also available on cell phones, tablets, etc from www.angp-hb.co.za or as an APP "Heart of Man" on Android phones.**

For **free** Gospel literature, books and tracts in over 540 languages, write to:

**E-MAIL: info@angp.co.za**

**ALL NATIONS GOSPEL PUBLISHERS**

**P.O. Box 2191, PRETORIA, 0001, R.S.A.**

(A Gospel Literature Mission financed by donations)

(Reg. No. 1961/001798/08)